## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජාතික සංවිධායක ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අත්අඩංගුවට ගැනීම හා ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට ඇති තර්ජනය.

අප පක්ෂයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතුමන්ව 2026.09.04 වන දින අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් අප පක්ෂය දැඩිව සැලකිලිමත් වන අතර පක්ෂයක් ලෙස අප එම ක්‍රියාව සම්පූර්ණයෙන් හෙලා දකිමු.

අප සලකනුයේ මෙය හුදෙක් නාමල් රාජපක්ෂ යන පුද්ගලයා අත්අඩංගුවට ගැනීමක් ලෙස නොව මුළු මහත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එල්ල කල දැඩි ප්‍රහාරයක් ලෙස වන අතර මේ තුලින් ආණ්ඩු බලය අවභාවිතා කිරීම යන ගැඹුරු ප්‍රශ්නාර්ථය නැගෙන බව සදහන් කරමු.

මේ වන විට අතිශය පීඩාවට පත් වී ඇති ශ්‍රී ලාංකේය ගොවි ජනතාව ඇතුලු වත්මන් ආණ්ඩුවේ අදූරදර්ශී හා අමනෝඥා ක්‍රියා දාමයක් යටතේ පීඩාවට පත්ව ඇති සමස්ථ ශ්‍රී ලාංකේය ජනතාව එක් කරගත් අති දැවැන්ත ජන රැළියක් එළඹෙන 2026 සැප්තැම්බර් මස 12 වන දි අනුරාධපුර නගරයේ පැවැත්වීමට සියලු කටයුතු සම්පූර්ණ වෙමින් තිබූ අවස්ථාවක හා ජන රැළිය සදහා දැවැන්ත ජන සහභාගීත්වයක් ඇති වන බවට තොරතුරු ලැබෙමින් තිබූ අවස්ථාවක මෙම අත්අඩංගුවට ගැනීම සිදු කිරීම ඉතා ප්‍රශ්න සහගත වේ. තවද නාමල් රාජපක්ෂයන් විසින් අනාගත ශ්‍රී ලංකාව සහ ලාංකීය තරුණ අනාගතය වෙනුවෙන් සිය දර්ශනය ජනගත කරමින් තිබූ අවස්ථාවක ඔහුගේ හඩ යටපත් කිරීමට ආණ්ඩුවට ඇති අවශ්‍යතාවය අප පක්ෂයක් ලෙස අවබෝධ කරගෙන සිටිමු.

ඒ අනුව අප විශ්වාස කරන්නේ මෙම අවස්ථාවේ මෙම සිදු කල අත්අඩංගුවට ගැනීම අහම්බයක් නොවන බවයි.

වත්මන් පාලකයින් ආණ්ඩුකරණයේ සියලු අංශයන්ගෙන් අසාර්ථක වී ඇති මොහොතක ඔවුන් විසින් මේ සිදුකරනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඉස්මතු වෙමින් පවතින මාලිමා ආණ්ඩු විරෝධී ජනමතය සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස රැස්වීමට අදහස් ප්‍රකාශ කිරීමට හා නිර්භයව තමන්ගේ සහ රටේ අනාගතය වෙනුවෙන් තීන්දු ගැනීමට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යටපත් කිරීමේ උත්සහයයි.

නාමල් රාජපක්ෂ මැතිතුමන්ව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්තුමන් වෙත 2026.09.04 ඉදිරිපත් කොට ගරු මහේස්ත්‍රාත්තුමන් විසින් ඔහුව 2026.09.18 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද අතර එය සිදු කරනු ලැබුවේ 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ 149 වන වගන්තිය යටතේය. එම ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කරනු ලබන සැකකරුවෙකු ඇප මත මුදා හැරීමට ගරු මහේස්ත්‍රාත්වරයාට ඇති සීමාවන් සම්බන්ධයෙන් අප දැනුවත් අතරම අප වෙත ඇති




නො. 1316, නෙළුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
இல. 1316, நெலும் மாவத்தை, ஜெயந்திபுர, பத்தரமுல்ல, இலங்கை.
No. 1316, Nelum Mawatha, Jayanthipura, Battaramulla, Sri Lanka.
Tel: 011 2866277 Fax: 011 2866007 Email: info@slpp.org.lk


CamScanner

ප්‍රශ්නය වන්නේ මීට පෙර අවස්ථා කිහිපයකදී පොලිසියට හා අධිකරණයේ පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කොට ඇති කිසිදු විශ්වාසනීයත්වයක් නොමැති එමෙන්ම අපරාධ වැරදි සම්බන්ධයෙන් විමර්ශනයට ලක්ව ඇති පුද්ගලයෙකුගෙන් ඕස්ට්‍රේලියාවට ගොස් ලබා ගත් ප්‍රකාශයක් මත පදනම්ව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මෙවැනි අත්අඩංගුවට ගැනීමක් සිදු කලේ කෙසේද යන කාරණයයි.

අප මවබිම තුල දූෂණය පිටු දැකීම සදහා අප පාලන කාලය තුල අප විසින් සම්මත කල දූෂණ විරෝධී නීති කිසිදු සාධාරණත්වයකින් තොරව නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකරමින් දේශපාලන ස්වාධීනත්වයකින් තොරව අපයෝජනය කරනු ලබන්නේ නම් එවැනි අවස්ථාවක නිහඩව නොසිට එයට විරුද්ධව නැගී සිටීමට ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතාවට අයිතියක් ඇති බවට අප දැඩිව විශ්වාස කරමු.

නාමල් රාජපක්ෂ මැතිතුමාට එරෙහිව නගා ඇති චෝදනා සියල්ල අප පක්ෂයක් ලෙස ප්‍රතික්ෂේප කරන අතර එම චෝදනා පදනම් විරහිත හා දේශපාලනිකව පොළඹවීමක් මත සිදු කරනු ලැබූ චෝදනා බව අපගේ විශ්වාසයයි. පක්ෂයක් ලෙස ශ්‍රී ලංකාවේ ජනතාව වෙත අප අවධාරණය කරන්නේ අප රට තුල තිබිය යුත්තේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන මිස දේශපාලනික න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන ආයතන නොවන බවයි.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විශාල බලතල සහිතව නිර්මාණය කරනු ලැබුවේ ශ්‍රී ලංකාව තුල සිදුවිය හැකි දූෂණ හෝ වංචා පිටු දැකීමට මිස දේශපාලනය සදහා අවියක් ලෙස භාවිතා කිරීමට නොවන බව අවධාරණය කර සිටිමු. තවද රට තුල පිහිටා ඇති ස්වාධීන රාජ්‍ය ආයතන දේශපාලනික තර්ජන සදහා මෙවලමක් වශයෙන් භාවිතා කිරීමට පෙළඹේ නම් මේ රටට සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන සියලු පුරවැසියන් ඒ සම්බන්ධයෙන් දැඩි අවධානයක් දැක්විය යුතුය.

**අද දින ඒ නාමල් රාජපක්ෂයන්ය.**

හෙට දින එය පවතින ආණ්ඩුවේ වැරදි විවේචනය කරන ඕනෑම දේශපාලනික නායකයෙකු හෝ සමාජ ක්‍රියාකාරියෙකු හෝ සාධාරනීයත්වය අගයන පුරවැසියෙකු විය හැකිය.

ඒ අනුව මේ රටේ නීතියේ ආධිපත්‍ය සහ යුක්තිය විශ්වාස කරන සියලු පුරවැසියන් සිවිල් සංවිධාන සහ යුක්තිය පසදලීමට සම්බන්ධ සියලු ආයතන සංවිධාන සහ පුද්ගලයින්ගෙන් අප ඉල්ලා සිටින්නේ රාජ්‍ය බලය අවභාවිතය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන දේශපාලනමය අවශ්‍යතා සදහා යොදා ගැනීමට එරෙහිව හඩ නැඟිය යුතු බවයි.

**පක්ෂයක් ලෙස වත්මන් ආණ්ඩුවට අප පහත කරුණු දැඩිව දක්වා සිටිමු.**

- ඔබට නායකයෙකු සිරගත කල හැකි නමුත් එම නායකයාගේ දර්ශනය මත පදනම්ව ඉදිරියට යන බලවේගය නැවැත්විය නොහැක.
- ඔබට එක් අයෙකුගේ හෝ කිහිප දෙනෙකුගේ හඩ නැවැත්විය හැකි නමුත් සියලු දෙනාගේ හඩ නැවැත්විය නොහැක.
- ඔබට ජනතාව බිය ගැන්වීමට උත්සහ කල හැකි නමුත් සමස්ථ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාශයන් සිරගත කිරීමට නොහැක.



CamScanner

- ඔබගේ ක්‍රියා තුලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බිය වැද්දවිය නොහැක.
- ඔබට අනුරාධපුර ජනතාව බිය ගැන්විය නොහැක.
- ඔබව සමස්ථ ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අභිලාෂයන් බියවද්දා නිහඩ කල නොහැක.
- 2026 සැප්තැම්බර් 12 වන දින පැවැත්වීමට නියමිත අනුරාධපුර මහ ජන රැළිය නාමල් රාජපක්ෂයන් පැතූ අයුරින්ම පවත්වනු ඇත.
- සමස්ථ ශ්‍රී ලංකාවාසී ජනතාව සමඟ එක්ව අප වඩාත් ශක්තිමත්ව, වඩාත් අධිශ්ඨාන පූර්වකව සහ වඩාත් එකමුතුව නැගී සිටින්නෙමු.
- අප විසින් සූදානම් කල ජන රැළිය දැවැන්ත සහ ශක්තිමත්ව ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක් ලෙස මේ වන විට නැගී සිටිමින් පවති. මෙම ක්‍රියාවලිය අපව තවත් ශක්තිමත් කොට ශක්තිමත්ව නැගී සිටිමේ අධිශ්ඨානයක් බවට පත්ව ඇත.
- මේ අනුව මේ රටේ නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතාවගෙන් හා විශේෂයෙන් අනුරාධපුර ජනතාවගෙන් සහ අප සියලු ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ 2026 සැප්තැම්බර් 12 වන දින අනුරාධපුරයට පැමිණ '' ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් බිය ගැන්වීමට මගින් අහිමි කල නොහැකි බවටත්, පොදු ජනතාවගේ හඬ සිරගත කල නොහැකි බවටත් '' සාමකාමී අයුරින් වත්මන් පාලකයින්ට පෙන්වා දෙන ලෙසයි.
- ගරු නාමල් රාජපක්ෂ මැතිතුමනි මේ අවස්ථාවේ අප ඔබ සමග නැගී සිටිමු.
- එමෙන්ම අප රටේ යුක්තිය විශ්වාස කරන සියලු පුරවැසියන් සමග අප නැගී සිටිමු.
- මෙරට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප නැගී සිටිමු.
- මෙරට නීතියේ ආධිපත්‍ය වෙනුවෙන් අප නැගී සිටිමු.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන දේශපාලන අවශ්‍යතාවයන් මත නොව ශ්‍රී ලාංකේය පුරවැසියන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය යන කාරණය වෙනුවෙන් අපි නැගී සිටිමු.
- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය යුක්ති ගරුක ප්‍රජාතන්ත්‍රවාදී දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් වෙනුවෙන් වූ අරගලය ඉදිරියට ගෙන යනු ඇත.

මෙරටේ දූෂණ මර්ධනය වෙනුවෙන් ගෙනා නීති දේශපාලනමය මර්ධනය වෙනුවෙන් හෝ විරුද්ධ දේශපාලන නායකයින් ගොදුරු කර ගැනීමට යොදා ගැනීමට එරෙහිව අප නැගී සිටිමු.

මාලිමා ආණ්ඩුවට අප ප්‍රකාශ කර සිටින්නේ ඔබ අපගේ නායකයෙකු සිරගත කොට ඇත.

නමුත් එතුලින් ඔබ මහජන බලවේගයන් අවදි කර ඇත.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දිනෙන් දින ශක්තිමත්ව නැගී සිටිනු ඇත.

ශ්‍රී ලාංකේය ජනතාව දිනෙන් දින ශක්තිමත්ව නැගී සිටිනු ඇත.

අප ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී හඬ කිසිදා නොවූ අයුරින් ශක්තිමත්ව ඇසෙනු ඇත.

**නීතිඥ සාගර කාරියවසම්**
**මහලේකම්**

**2026.09.05**